# 13 හොඳට නරකට දෙකට ඇසුර ය

ශ්‍රද්ධාවන්ත පින්වත්නි,

මේ වෙලාවට නියමිතව තිබෙන්නෙ ජාතක දේශනාව යි. ජාතක කියල කියන්නෙ අප මහ බෝසතාණන් වහන්සේ පෙරුම් පුරන කාලෙ ගත කළ ජීවිත කතා. ඒ විදියෙ ජාතක කතා පන්සිය පණහක් තිබෙනවා. ඒ අතරින් අද මා ඔබට දේශනා කරන්න තෝරාගත්තෙ ''සත්ති ගුම්බ'' ජාතකය. සත්ති කියන්නෙ ආවුද. ගුම්බ කියන්නෙ පඳුර, නැත්නම් ගොඩ. ආවුද ගොඩක් උඩට වැටුණු ගිරා පැටියෙකුට තැබූ නම තමයි සත්ති ගුම්බ කියන්නෙ. මෙය දෙව්දත් තෙරුන් වහන්සේ ගැන කියවෙන කතාවක්.

## වත්මන් පුවත

දෙව්දත් තෙරුන් වහන්සේ කියන්නේ මහ නපුරු කෙනෙක්. උන්වහන්සේ ළඟ සිටියෙත් වැඩිදෙනෙක් ඒ වගේම පව්වු නපුරු අය. දෙව්දත්තෙර බුදුහාමුදුරුවන්ට විරුද්ධ ව නොයෙක් පව්වුකම් කළා. අන්තිමේදී ගිජුකුළු පව්ව මුදුනේ සිට බුදු හාමුදුරුවන්ගේ හිස මතට ගලක් පෙරළුවෙ උන්වහන්සෙ මරන්නයි. මේ තුන්ලෝකෙ කිසිකෙනෙකුට බුදුහාමුදුරුවන් මරන්න බැහැ. ඒ වුනත් එදා ගල් පතුරක් විසිවෙලා ඇවිත් වැදිලා උන්වහන්සේගෙ පාදයේ ලේ ගැලීමක් ඇතිවුණා. ඒ වේදනාවෙන් වැඩ ඉන්නා බුදුහාමුදුරුවන් බලන්න වැල නොකැඩී සෙනඟ එන්න පටන් ගත්තා. එයින් ඒ සෙනසුන ඉතාම අවිවේකී තැනක් වුණා. ඒ නිසා තමන්වහන්සේ, ජනගහණය අඩු මණ්ඩකුච්ඡි ප්‍රදේශයට ගෙනයන්නැයි, භික්ෂූන් වහන්සේලා ට වදාළා. උන්වහන්සේලාත් එසේ කළා. එහිදී ජීවක වෙදදුරුතුමා උන්වහන්සේ සුවපත් කළා.

එදා හාමුදුරුවරුන් වහන්සේලා අතර ''බලන්න, මේ දෙව්දත් තෙරුන් වහන්සේ පව්වු පිරිසක් වට කරගෙන පව්වුකම් කරන හැටි'' යැයි කතාබහක් ඇතිවුණා. එය ඇසූ බුදුහාමුදුරුවො ''මහණෙනි, අද පමණක් නොවෙයි,

පෙරත් මේ දෙව්දත් පව්ටු මිනිසුන්ගෙ ඇසුරට වැටිලා පව්ටු කෙනෙක් වුණා'' යැයි වදාරල, හාමුදුරුවරුන්ගේ ඉල්ලීම නිසා මේ ජාතක කතාව දේශනා කළා.

## යටගිය පුවත

පින්වත්නි, එකමත් එක කාලයක අපමහ බෝසතාණන් වහන්සේත් දෙව්දත් තෙරත් එකම ගිරා පවුලක ඉපදිලා හිටියා. ඔවුන්ගෙ කූඩුව තිබුණෙ කන්දක් මුදුනෙ ඉඹුල් ගසක බෙනයක. දවසක් මහ සුළඟක් ඇවිත් ඒ ගස කඩා වැටුණා. සුළඟට හසුවෙලා ගිරා පැටව් දෙන්න කන්දෙ දෙපැත්තට වැටුණා. එක පැත්තක තිබුණෙ හොර ගුහාවක්, එක ගිරා පැටියෙක් වැටුණෙ ඔවුන්ගෙ ආයුධ ගොඩට. හොරු ඒ ගිරා පැටියා සත්තිගුම්බ කියල නම් කරලා ඇතිදැඩි කළා. කන්දෙ අනෙක් පැත්තෙ තිබුණෙ තාපසාරාමයක්. අනෙක් ගිරා පැටිය වැටුණේ එතන මල් ගොඩට. තාපසයො ඒ පැටියට පුෂ්පක කියලා නම තබාගෙන ඇතිදැඩි කළා.



මේ අතරෙ දවසක් පඤ්චාල රටේ රජතුමා පිරිවරත් සමග ඒ කැලේට ගියා දඩයමේ. කාගෙ හෝ ළඟින් සතෙක් පැනල ගියොත් එයාට දඩ ගහනව

කියල ඒ දඩයමේ සම්මුතියක් තිබුණා. එදා හරියට ම රජතුමා ළඟින් මුවෙක් පැනල ගියා. රජතුමාට හරිම ලැජ්ජාව. එතුමා රියදුරත් එක්ක අශ්වරථයෙන් මුවා ලුහුබැන්ද. ඒත් මුවා හමුවුණේ නැහැ. රජතුමා අතරමං වුණා. එතුමාට හරි වෙහෙසයි. රියදුරා ගසක්මුල පලසක් අතුරල දුන්නා. රජතුමා එහි මඳක් ඇලවුණා. එකවරම අමුතු හඬක් ඇහිලා රජතුමාට ඇහැ ඇරුණා. එවිටයි දැක්කෙ එතන හොර ගුහාව. ඒ වෙලාවෙ හොරු හිටියෙ නැහැ. හොරකමේ ගිහිල්ලා. පතිකෝලම්බ කියන මුරකාරය යි, ගිරව යි විතර යි හිටියේ. ඒ ඇහුණෙ ගිරවගෙ හඬ.

## නපුරු ඇසුරක නපුරුකම

''ඒයි, ඒයි, පතිකෝලම්බ, අන්න, අන්න, කවුදෝ ගහක් මුල මහදවල් නිදි, නළල්පට බැඳලා රන් ආභරණ පැළඳගෙන ඉන්නෙ. රජ කෙනෙක්, ඉර වගේ බබලනවා. ඉක්මන් කරමු, ඔක්කොම බඩු පැහැරගෙන මරල, කොළ අතුවලින් වහල දමමු.'' කියල ගිරව කෑ ගහනවා. අහර පිසිමින් සිටි පතිකෝලම්බ එළියට ඇවිත් බලලා ''ඒයි සත්තිගුම්බ නුඹ දොඩවන්නේ පිස්සුවෙන් ද? රජවරු කියන්නේ ගින්දර වගේ, අපට කිට්ටුවෙන්නවත් පුළුවන් ද?" කියල ගිරවට බැණ වැදුණා,

මේ කතාබහ ඇහිල රජතුමා කලබල වුණා. ''මිතුරු රියදුර, ගිරවගේ කතාව නම් සුබ නැහැ, අපි ඉක්මනින් වෙන තැනකට යමු.'' කියල එතැනින් පිටවුණා. ඒක දැකල ගිරවා ආයෙත් කෑගහන්න පටන්ගත්තා.

''කෝ, කෝ, මෙතන හිටිය හොරු කොහේ ගිහින් ද ඕන වෙලාවට මුන් නැහැ, අන්න අර පඤ්චාලය පැනල යනවා, දුනු ගනිල්ලා, හෙල්ල ගනිල්ලා, ලුහු බැඳපල්ල, පඤ්චාලයට පණ පිටින් නම් යන්න දෙන්න එපා". කිය කියා රජු නොපෙනී යන තුරුම සත්තිගුම්බ මොර දුන්නා.

## මෙන්න ආගන්තුක සත්කාරය

රියදුරත් සමග එතැනින් මග හැරගිය රජතුමා කන්දෙ අනෙක් පැත්තට ගියා. එතන තාපසාරාමය. එතනත් තවුසො හිටියෙ නැහැ. ගිරවා විතරයි සිටියේ. තවුසන් ආගන්තුකයන්ට සලකන හැටි දැකල පුරුදු ගිරව පෙරගමන් කරලා රජතුමා සාදරයෙන් පිළිගත්තෙ මෙහෙම යි.

''දේවයන් වහන්ස, ඔබතුමා සැපත් වීම කොතරම් අගේ ද, අපෙත් රජතුමා ඔබයි. ඔබතුමා පැමිණියේ අපේ පිනට, (එන්න, අසුන් ගන්න,) ඔබතුමාට අපෙන් කෙරෙන්න ඕන රාජකාරිය කුමක් ද යි වදාරන්නැ'' යි කීවා.

ඒ කතාව ගැන රජතුමාට පුදුමයි, ඒ වගේම සතුටුයි.

ඊළගට රජුට කුසගිනි ඇතැයි සිතූ ගිරවා,

''දේවයන් වහන්ස, මෙන්න තිඹිරි ගෙඩි, මොර ගෙඩි, මී ගෙඩි, එරමිනිය ගෙඩි තිබෙනවා. මේවා පුංචි වුණාට රසයි අනුභව කරනු මැනවැ'' යි කියා තවුසන් තමාට දී තිබුණු පළතුරු රජතුමාට පෑවා. ඒ වගේම,

දේවයන් වහන්ස, මේ පැන් හරිම සීතලයි ගිරි කඳුරුවලින් ගෙනා පැන් කැමතිනම් බොනු මැනවැයි'' කියා පැන් තිබෙන තැනත් පෙන්නුවා,

බලන්න, මේ ගිරව තමන්ට හරිහැටි ආගන්තුක සත්කාර කරන්න බැරි වීම නිසා දුක් වෙන හැටි. ඔහු කියනවා,

''දේවයන් වහන්ස, මෙහේ ඉන්න තවුසො පලවැල සොයන්න කැලේට ගිහින්, ඔබතුමා ම නැගිටල පිළිගන්න. ඔබතුමාට මේවා පිළිගන්වන්න අනේ මට අත් දෙකක් නැහැ නේ'' කියලා.

මේ ගිරවා ගැන හොඳට ම පැහැදුණු රජතුමා අනෙක් ගිරවගෙන් තමාට වුණු ඇබැද්දිය ගැන කියල ''ඒ ගිරව හරි නපුරුයි. ඒත් ඔබනම් හරි කරුණාවන්තයි'' කීවම ගිරවා කියනවා;

''දේවයන් වහන්ස, අප දෙන්න එක මවුකුසේ උපන්න, එකම ගසේ වැඩුණු සොහොයුරෝ. සුළඟට අප දෙන්න දෙපැත්තට වැටුණා. ඔහු සොරුන් ළඟ, මා තවුසන් ළඟ, ඔහු අසත්පුරුෂයන් ළඟ; මා සත්පුරුෂයන් ළඟ, අප දෙන්න ඒ දෙපළෙ හැටියට හැඩ ගැසුණා.

එතන තිබෙන්නේ, වධ හිංසාව, බන්ධනය, රැවටිල්ල, කපටිකම, ගම් පැහැරීම, බලහත්කාරකම වගේ දේවල්. ඔහු ඒවා පුරුදු වෙනවා.

මෙතන තිබෙන්නේ, සත්‍යය, ධර්මය, අහිංසාව, සංවරය, ඉන්ද්‍රීය දමනය වගේ දේවල්. දේවයන් වහන්ස, මා ආගන්තුකයින් ආදරයෙන් පිළිගෙන, බීමට පැන්, හිඳගන්නට අසුන් දීල වතාවත් පුරන පිරිසකගෙ ඇකයේ හැදුණෙ.

ඊළඟට පුෂ්පක ගිරවා, ආශ්‍රය කියන එක කෙනෙකුට හොඳට වගේම නරකටත් බලපාන හැටි මෙහෙම කියලා දුන්නා.

> **යං යං හි රාජ භජති සන්තං වා යදි වා අසං,**
> **සීලවන්තං විසීලං වා වසං තස්සේව ගච්ඡති**

දේවයන් වහන්ස, කවුරුන් හෝ කෙනෙක්. සත්පුරුෂයා ය, අසත්පුරුෂයා ය, සිල්වතා ය, දුස්සීලයා ය කියන මේ කුමන විදියෙ කෙනෙකු ඇසුරු කළත්, ඔහුත් ඒ විදියේම කෙනෙක් වෙනව.

> **යාදිසං කුරුතෙ මිත්තං යාදිසඤ්චූපසෙවති**
> **සොපි තාදිසකො හොති සහවාසො හි තාදිසො**

ඒ වගේම කෙනෙක් කවුරුහරි කෙනෙකු මිතුරු කර ගන්නවා නම්, කෙනෙකු ඇසුරු කරනවා නම්, ඔහුත් ඒ වගේම කෙනෙක් වෙනව. ආශ්‍රයෙ හැටි එහෙමයි.

ඊතලයකට පොවපු විෂ, ඊතල කොපුවේත් තැවරෙනවා වගේ පව්වූ කම් කරන අය ඇසුරු කරන්න ගියොත් පව්වූ කම් නොකරන අයත් ඒ ගොඩටම වැටෙනවා. ඒ නිසා නුවණැත්තො තමනුත්, නොකළ පව්වලට පැටලේ ය කියන බියෙන් පව්වූ මිතුරන්ගෙන් ඈත්වෙනවා.

> **පූතිමච්ඡං කුසග්ගෙන යො නරො උපනය්හති,**
> **කුසාපි පූති වායන්ති එවං බාලූපසෙවනා.**

(කුසතණ කියන්නෙ කොතරම් ශුද්ධ වස්තුවක් වුණත්) කෙනෙක් කුසතණවලින් කුණු මසක් දවටගෙන ගියොත් කුසතණත් ගඳ ගහනවා. බාලයන් ඇසුරු කිරීමත් ඒ වගේ තමයි.

> තගරඤ්ච පලාසෙන යො නරො උපනය්හති,
> පත්තාපි සුරභි වායන්ති එවං ධීරූපසෙවනා.

කෙනෙක් කොලයකින් තුවරළා දවටගෙන ගියොත් ඒ කොළයත් සුවඳ හමනවා. නුවණැත්තන් ඇසුරු කිරීමත් ඒ වගෙයි.

ඒ නිසා පින්වතුනි, ඔබගේ පවිටු මිතුරන්ගෙන් ප්‍රවේශම් වෙන්න. කළණ මිතුරන් ම ඇසුරු කරන්න. ඔබ සැමට තිසරණ සරණයි !

### ක්‍රියාකාරකම 13.1

සුදුසු වචන යොදා පහත සඳහන් වැකිවල හිස්තැන් පුරවන්න.

1. බුදුන් වහන්සේට ප්‍රතිකාර කරන ලද්දේ ............................ නම් වෛද්‍යවරයා විසිනි.
2. දෙව්දත් තෙරණුවන් බුදුන් වහන්සේට ගලක් පෙරළන ලද්දේ ..................... පර්වතය මුදුනේ සිට ය.
3. ගිරා පැටව් දෙන්නාගේ වාසස්ථානය වූයේ ....................... ගස් බෙනයක ය.
4. සුළඟින් පාවී ගොස් අවි ආයුධ ගොඩට වැටුණේ ............................ ගිරා පැටවා ය.
5. ගිරා පැටියා ................................ දන්නා පිරිසකගේ ඇකයේ වැඩුණේ ය.
6. බුදුරජාණන් වහන්සේ බලන්න සෙනග පැමිණීම උන්වහන්සේගේ ............................ ට බාධාවක් වුණා.
7. සොර කණ්ඩායමේ මුරකරු ............................ යි.
8. රජුගේ වෙහෙස නිවා ගැනීමට රුක් සෙවණක පළසක් එලන ලද්දේ ............................ විසිනි.
9. රජුට මුලින් ම මුණ ගැසුණේ ............................ නම් ගිරා පෝතකයා ය.
10. යමෙකුගේ යහපත් බව හෝ අයහපත් බව ............................ නිසා සිදු වෙයි.

**ක්‍රියාකාරකම 13.2**

1. මේ ජාතක කතාවේ සඳහන් ගාථා අරුත් සහිතව වනපොත් කරන්න.

2. ගිරා පැටියාගේ ආගන්තුක සත්කාරය අගය කරමින් පන්තියේ සංවාදයක් පවත්වන්න. (කාගේත් අදහස් විමසන්න)

**ජීවිතයට ඔවදනක්**

**"උදාර චරිතානාංතු වසුධෛව කුටුම්බකම්"**

උදාර චරිත ඇති අයට මුළු ලොව එකම පවුලකි.